
**මානව මහිම – 1**

දුරකථනය හඳුන්වන ඉංග්‍රීසි වදන වන Telephone යන්න බිහි වුයේ ග්‍රීක් බසේ එන tele (දුර) හා phone (ශබ්දය) එක්වීමෙනි.

# දුරකථනයෙන් වූ පෙරළිය




**1876 දි බිහිවූ මුල්මම දුරකථනය**

දුරකථනයේ බිහිවීම ලොව තුළ අතිවිශාල පෙරළියක් ඇති කළ සිදුවීමක්. ලෝකය කුඩා ගම්මානයක් බවට පත් කරන්නට මුල්වූ උපකරණයක් විදිහට එය හැඳින්විය හැකි යි.

1876 මාර්තු 10 වැනිද තමයි, දූරකථනයේ උපන්දිනය.

"වොට්සන් මහත්මයා කරුණාකර මෙහාට එන්න. මෙතනට ඔබ අවශ්‍යයි" ඒ ලොව පළමු දූරකථන පණිවුඩය වුවත් එය හිතාමතා දුන් පණිවුඩයක් නොවෙයි.

දූරකථනය ලොවට හඳුන්වා දුන් ස්කොට් ජාතික ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල් අඩි 50 ක් පමණ දුරින් සිටි තම සේවකයකු වූ තෝමස් වොට්සන්ට කෑගැසුවේ තමාගේ ඇඳුමේ වැදුණ බැටරි අම්ල කරවා ගැනීම සඳහා යි. ඒ හඬ තෝමස් කණට තබා සිටි උපකරණය හරහා ගලා ආවේ ලොව පළමු දූරකථනය ලොවට බිහි කරමින්.



**කාබන් සම්ප්‍රේෂකය**


## කාබන් සම්ප්‍රේෂකය

1878 දි තෝමස් අල්වා එඩිසන් නව මාදිලියේ රිසීවරයක් හඳුන්වා දුන්නා. එය කාබන් පෙත්තක් (කාබන් බෙරයක්) හරහා විද්‍යුතය යැවීමෙන් ශබ්දය සම්ප්‍රේෂණය කළ හැකි උපකරණයක්. එය හැඳින්වූවේ කාබන් සම්ප්‍රේෂකය ලෙසයි.

දූරකථනය ලොවට බිහි කළේ ග්‍රැහැම් බෙල් වුවත් දූරකථනයේ සංකල්පය හඳුන්වා දුන් ජර්මන් ජාතික පිල්ප් රෙයිස් (Philipp Reis) වත් අපට අමතක කරන්න බැහැ.

ශබ්දය විද්‍යුතය හරහා සම්ප්‍රේෂණය කළ හැකි බව රෙයිස් කීවේ 1861 දී ය.

ඔහු මේ බව පෙන්වීමට උපකරණයක් සැදූ මුත් ඉන් කළේ විවිධ ශබ්ද (ලෝහ කම්පනය කරවීමෙන් ඇති වන) සම්ප්‍රේෂණය මිස කථාබහ කිරීමක් නොවෙයි. ඔහු මේ තාක්ෂණය යොදා ගත්තේ සෙල්ලම් බඩු හැදීම සඳහා යි.




**ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්**


## පොටෝපෝනය

ආලෝකය ශබ්දය සම්ප්‍රේෂණය කරන මාධ්‍යයක් ලෙස පළමුව යොදා ගත්තෙත් ඇලැක්සැන්ඩර් ගැහැම් බෙල් (1880) මෙහිදී ආලෝක ප්‍රභවය ලෙස සූර්යාලෝකය යොදා ගත් අතර සෙලිනියම් කෝෂයක් ද ආධාර කර ගනු ලැබුවා. පොටෝපෝනය යනුවෙන් හැඳින්වෙන්නේ මේ උපකරණය යි.

**පොටෝපෝනය – 1**



**පොටෝපෝනය – 2**



1926 දී අන්තර් සාමුද්‍රික දුරකථන සේවාවක් (කෙටි තරංග හරහා) ඇරඹුණා. ට්‍රාන්ස් අත්ලන්තික් කේබල් සේවාව ඇරඹුණේ 1956 දී ඒ ස්කොට්ලන්තයේ සිට නිව්පවුන්ඩ්ලන්තයට.

## සෙලියුලර් දුරකථන

දුරකථනය අතේ ගෙන යා හැකි තත්ත්වයට පත්වීම දුරකථන ලොවේ සිදුවූ විශාල පෙරළියක්

ලංකාවට සෙලියුලර් දුරකථන හඳුන්වා දුන්නේ සෙල්ටෙල් සමාගම 1985 දී.


## බෙඩ් ටයිම් ස්ටෝරිස්

තින්ද නැති රැයක ලිංගික ක්‍රියා ඇතුළත් කාම කතා රස මුසු ලෙස ග්‍රාහකයාට ඉදිරිපත් කරන දුරකථන ජාල ප්‍රථමයෙන් ඇරඹුණේ 1960 දශකයේ, ඇමරිකාවේ දී.

60 දශකයේ සිට නොකඩවා පවත්වාගෙන එන එවැනි දුරකථන ජාලයකට උදහරණයක් වන්නේ බෙඩ් ටයිම් ස්ටෝරි ය. දැනට ඇමරිකාවේ ක්‍රියාත්මක වන තවත් එවැනි දුරකථන ජාලයක් වන්නේ සර්ඩ් ඇක්සන් ඇඩල්ස් ඔන්ලි, ලෙස්බියන් ඔන්ලි යනාදිය යි.

## ජායාරූපත් හුවමාරු කළ හැකි යි

කාර්යබහුල ජපාන පෙම්වතුන්ට ඉටු දෙවියකු බඳු යි. VP 210 නමැති අලුත් ම දුරකථනය. මෙහි ඇති P-mail delux පහසුකම ඔස්සේ ජායාරූප ආදිය තම පෙම්වතාට / පෙම්වතියට යැවිය හැකි යි. මේ පහසුකම ලැබෙන්නේ දුරකථනයේ පුංචි තිරයක කථා කරන කෙනාගේ ජායාරූපය දර්ශනය වීමට අමතරව යි.



1896 – 1900 බ්‍රිතාන්‍යයේ භාවිත වූ දුරකථනයන්

## හඩ හා රුව මුසු කළ ISDN

දුරකථන ලොවේ අලුත්ම පෙරළිය ලෙසින් හැඳින්විය හැක්කේ ISDN හෙවත් ඒකාබද්ධ සේවා සංඛ්‍යාංක ජාලය යි. මේ ජාලයට සම්බන්ධ වන ග්‍රාහකයකුට ලැබෙන සුවිශේෂ පහසුකම වන්නේ ඇමතුම දෙන පුද්ගලයාගේ රූපය දැකගත හැකි වීම යි.



ISDN


මේ ක්‍රමය නිසා ව්‍යාපාරික ප්‍රජාවට අධ්‍යාපන, වෛද්‍ය, විද්‍යා ඇති ක්ෂේත්‍රවලට සැලසෙන සෙත සුවිශාල යි. ලොව ඕනෑම තැනක සිට සජීවීව පෙනී සිටිමින් සාකච්ඡාවලට සහභාගි වන්නට, අධ්‍යාපන හෝ වෛද්‍ය උපදෙස් ලබාදෙන්නට හැකියි පරිගණක හෝ රූපවාහිනී තිරයක් හරහා. 1999 දී මේ ක්‍රමය ශ්‍රී ලංකාවට ද හඳුන්වා දෙනු ලැබුවා.




## සන්නිවේදන චන්ද්‍රිකා යොදා ගැනීම

වර්තමානයේ දුරකථන පණිවුඩ හා දත්ත හුවමාරුව සඳහා රටවල් 110 කට වැඩි ගණනක පෘථිවි මධ්‍යස්ථාන පිහිටා තිබෙනවා. (පෘථිවි මධ්‍යස්ථාන යනු චන්ද්‍රිකාවට සංඥ ලබා දෙන පෘථිවියේ පිහිටා ඇති පාලන මධ්‍යස්ථානය යි)

ලොව පළමු සන්නිවේදන චන්ද්‍රිකාව බිහිවූවේත් දුරකථන පණිවුඩ ක්‍රමය දියුණු කරවීමේ අරමුණෙනි. ඒ 1962 ජූලි 10 ඇමරිකාව විසින් යවනු ලැබූ ටෙලිස්ටාර්. අත්ලාන්තික් සයුර හරහා දුරකථන සංවාද පැවැත්වීමට ඉඩකඩ ලබාදීමයි. එමගින් කෙරුණේ. චන්ද්‍රිකාවක් ලෙස නොසැලකුණත්, චන්ද්‍රිකාවක මුල් අවධිය ලෙස සැලකෙන එකෝ I නම් ප්ලාස්ටික් ඇලුමිනියම් බැලූනය 1958 දී යවනු ලැබූ අතර එහි අරමුණ වූවේද දුරකථන ක්‍රම දියුණුව සඳහා දත්ත ලබා දීමයි. ❑



නවීනතම ජංගම දුරකථන

චිත්‍ර
කුසල ජයන්ත
සටහන
මනෝජ් රත්නායක